පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 13

# තෙවන වාර පරීක්ෂණය 2024
## ඉන්දීය ඉතිහාසය

පාසලේ නම : .............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය 3

❖ අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ.** එම නොගැළපෙන නම් කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

01. 1) ෆාහියන් 3) ඉත්සිං 5) හියුංසාං
2) චිලුම් 4) තාරානාථ් (.........)

02. 1) ඛයිබර් 2) බෝලාන් 3) රායිචූර්
4) මක්‍රාන් 5) බැරෝඩා (.........)

03. 1) රාමායණය 2) මහාභාරතය 3) සිලප්පදිකාරම්
4) රාජතරංගනි 5) මණිමේඛලා (.........)

04. 1) ආර්.ඩී බැනර්ජි 2) මෝටිමර් විලර් 3) ස්ටුවට් පිගොට්
4) ජෝන් මාර්ෂල් 5) කේ.ඒ නීලකන්ඨ ශාස්ත්‍රී (.........)

05. 1) ගාන්ධාර 2) මගධ 3) කෝසල
4) වත්සය 5) අවන්ති (.........)

06. 1) මත්ස්‍ය පුරාණ 2) විෂ්ණු පුරාණ 3) පෙරිය පුරාණ
4) වායු පුරාණ 5) ස්කන්ධ පුරාණ (.........)

07. 1) මහේන්ද්‍රපාල 2) ගෝපාල 3) ධර්මපාල
4) දේවපාල 5) නාරායන (.........)

08. 1) කණිෂ්ක 2) හර්ෂවර්ධන 3) දෙවන පුලකේෂි
4) දෙවන ධ්‍රැවසේන 5) ධර්මපාල (.........)

09. 1) වික්‍රමශිලා 2) පාටලීපුත්‍ර 3) නාලන්දා
4) තක්ෂිලා 5) ජගද්දලා (.........)

10. 1) ඉන්දු - ග්‍රීක 2) ශකවරු 3) මෛත්‍රිකයෝ
4) පාර්තියන්වරු 5) පල්ලවයෝ (.........)

❖ අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙක **නොගැළපේ. එම නොගැළපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

11.
1) චම්පා - අංග
2) වාරනාසි - කාසි
3) කුසිනාරා - සූරසේන
4) ශ්‍රාවස්ති - කෝසල
5) උජ්ජයිනි - අවන්ති (………)

12.
1) වරුණ - ආකාශයට අධිපති
2) පෘථිවි - පොළවට අධිපති
3) ඉන්ද්‍ර - සතුන්ට අධිපති
4) අග්නි - ගින්නට අධිපති
5) ඌෂා - අරුණෝදයට අධිපති (………)

13.
1) බිම්බිසාර - වෛශාලි
2) බින්දුසාර - අශෝක
3) සමුද්‍ර ගුප්ත - ස්කන්ධ ගුප්ත
4) ප්‍රභාකවර්ධන - හර්ෂවර්ධන
5) ධර්මපාල - දේවපාල (………)

14.
1) කන්‍යා කුබ්ජ - ප්‍රතිහාර
2) ගුර්ජර ප්‍රතිහාර - චාලුක්‍ය
3) දේවගිරි - යාදව
4) බෙංගාලි - පාල
5) පාඨලීපුත්‍ර - පුෂ්‍යභූති (………)

15.
1) සමුද්‍රගුප්ත - අලහබාද්
2) කණිෂ්ක - හෝසාස්කොයි
3) දෙවන පුලකේෂී - අයිහෝල්
4) බාරවේල - හත්ථිගුම්බා
5) රුද්‍රදාමන් - ජුනාගාද් (………)

❖ අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු Y තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. **නිවැරදි** සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| | X | Y |
|---|---|---|
| i. | චන්ද්‍ර ගුප්ත මෞර්ය | A කාලිංගය ජය ගැනීම |
| ii. | මිනැන්ඩර් | B වයඹ දිග ඉන්දියාවේ යවන පාලකයෙකි. |
| iii. | අශෝක | C අසූකෝටියක් ධනය රැස් කිරීම. |
| iv. | බින්දුසාර | D චානක්‍ය පුරෝහිත වේ. |
| v. | ධනනන්ද | E අමිත්‍රඝාතක නම් විය. |

1) BEDCA 2) ADCBE 3) DBAEC
4) CAEDB 5) ECBAD (………)

17.

| | X | Y |
|---|---|---|
| i. | මහීෂ මණ්ඩල | A රක්ෂිත |
| ii. | වනවාසී | B මහාදේව |
| iii. | ස්වර්ණභූමි | C මජ්ජන්තික |
| iv. | අපරන්තක | D සෝණුත්තර |
| v. | ගන්ධාර | E මහාධර්ම රක්ෂිත |

1) CBADE 2) CDEBA 3) CADEB
4) CAEBD 5) CEABD (………)

18.

| | X | Y |
|---|---|---|
| i. | ග්‍රාමණී | A ගම්පාලක ප්‍රධානියා |
| ii. | ජන | B ගෝත්‍රික සභාපති |
| iii. | විෂ් | C ගෝත්‍රයේ නායක |
| iv. | රාජන්‍ය | D විෂ් කිහිපයක් එක්වූ පාලනයක් |
| v. | සමිති | E ගම් කිහිපයක් එක්වූ පාලනයක් |

1) ADECB 2) ACEBD 3) ABCED
4) ADBCE 5) ACBED (………)

19.

| | X | | Y |
|---|---|---|---|
| i. | ඩිමොකොස් | A | පුෂ්‍යමිත්‍ර ශුංග |
| ii. | දණ්ඩින් | B | බින්දුසාර |
| iii. | ෆාහියන් හිමි | C | හර්ෂවර්ධන |
| iv. | හියුං සාං හිමි | D | දෙවන චන්ද්‍රගුප්ත |
| v. | පතාංජලී | E | දෙවන නරසිංහ වර්මන් |

1) ADCBE　　2) BEDCA　　3) CAEDB
4) DBAEC　　5) ECBAD　　(………)

20.

| | X | | Y |
|---|---|---|---|
| i. | තෝරමාන | A | ශක ශත්‍රප |
| ii. | නහපාන | B | ප්‍රතිහාර |
| iii. | ඩෙමිට්‍රියස් | C | හූන |
| iv. | හුවිෂ්ක | D | කුෂාණ |
| v. | වත්සරාජ | E | ඉන්දුග්‍රීක |

1) CAEDB　　2) CDABE　　3) CEDBA
4) DBAEC　　5) ECBAD　　(………)

❖ අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

21. අර්ථ ශාස්ත්‍ර

1) චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ උපදේශක කෞටිල්‍යගේ කෘතියක් ලෙස සැලකේ.
2) මෞර්යය පාලනය ගැන තොරතුරු ලබාගත හැකි වැදගත් මූලාශ්‍රයකි.
3) එය සංස්කෘත භාෂාවෙන් රචනා කර ඇත.
4) පුරාණ ඉන්දියාවේ රාජ්‍ය පාලනය ගැන ඇති එකම ග්‍රන්ථයයි.
5) මෙය මැකියාවලිගේ කුමාරයා කෘතිය හා සමානවේ.　(………)

22. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සමාජීය තත්වය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) විධිමත් ජල පරිවහනය සහ පවිත්‍රතා පද්ධති ස්ථාපිතව පැවතුණි.
2) කුල භේදයක් නොවීය.
3) ගෝත්‍ර හා පවුල් වශයෙන් සංවිධානය විය.
4) ගොඩනැගිලි බොහෝමයක් තනා ඇත්තේ ගල්වලිනි.
5) ශිෂ්ටාචාරය බිඳ වැටීමට බැහැරින් පැමිණි ආක්‍රමණ හේතුවිය.　(………)

23. ඍග් වෛදික යුගයේදී
   1) විශාල ජනාවාස සප්ත සින්දු ප්‍රදේශයේ පිහිටා ඇත.
   2) ආර්‍යයයෝ විශාල ගෝත්‍ර වලට බෙදී සිටියහ.
   3) ඔවුහු අනාර්ය දස්‍යුන් සමඟ සටන් කළහ.
   4) රාජන් ගෝත්‍රයේ ආරක්ෂකයා විය.
   5) වර්ණ ක්‍රමය සමාජයෙහි දැඩි ලෙස මුල්බැස නොතිබුණි. (………)

24. කාසි
   1) ලෝහයෙන් තනා ඇති කාසිවල විවිධ සංකේත ඇත.
   2) හස් එබූ කාසි වර්ගය කහාපන නමින් හැඳින්වේ.
   3) බැක්ට්‍රියානු ග්‍රීකයන් නිකුත් කළ කාසි වයඹදිග ඉන්දියාවෙන් හමු වී ඇත.
   4) ගුප්තයන් විසින් උසස් තත්වයෙන් කාසි නිකුත් කර ඇත.
   5) සාතවාහන පාලකයෝ කාසි නිකුත්කර නැත. (………)

25. අරාබි ආක්‍රමණ
   1) ඉස්ලාම් ආගම වැළඳ නොගත් හින්දුවරුන්ගෙන් ජිෂ්‍යා නම් බද්දක් අයකරන ලදි.
   2) ක්‍රි.ව 712 දී මොහොමඩ් බින් කාසිම් යටතේ පැමිණි අරාබි හමුදා දාහීර් රජු යටතේ වූ සින්ඩ් ප්‍රදේශ යටත් කර ගැනුනි.
   3) අරාබි පාලකයන් විසින් ඔවුන් යටතේ වූ ප්‍රදේශවල අරාබීන් පදිංචි කිරීමට පෙළඹුනහ.
   4) ඉන්දියාවෙන් අරාබීන් පලවා හැරීමට රාජ්පුත් පාලකයෝ අවසානයේදී සමත් වූහ.
   5) බැග්බෑඩයේ කාලිප්වරයා විසින් සින්ඩ් හි ආණ්ඩාකාරයා ලෙස ජුනයිඩ් පත්කරන ලදි. (………)

❖ අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නොගැළපේ.** එම නොගැළපෙන කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

26. සාහිත්‍ය මූලාශ්‍ර
   A හෙරඩෝටස් ඉන්දියාව පිළිබඳව තොරතුරු පළමුවෙන්ම ඉදිරිත් කළ විදේශීය ලේඛකයා විය.
   B පැරණි ඉන්දීය සාහිත්‍යය ආගමික ස්වරූපයක් ගනී.
   C වෛදික සාහිත්‍යය මඟින් බොහෝ ඓතිහාසික තොරතුරු ලබාගත හැකිය.
   D රාජතරංගනි ග්‍රන්ථයේ රචකයා වූ කල්හාන කාශ්මීරයේ ඉතිහාසය ගැන තොරතුරු ඉදිරිපත් කර ඇත. (………)

27. ඉන්දීය භූගෝලීය ලක්ෂණ
   A මක්‍රාන් දුර්ග මාර්ගය ඉන්දියාවට බැහැරින් පිවිසිය හැකි පහසුම මාර්ගයයි.
   B ගංගා යමුනා තැනිතලාව විශාල අධිරාජ්‍යය වල මධ්‍යස්ථානය විය.
   C හිමාලය කඳුවැටි වැදගත් වනුයේ එම කඳුවැටි ආශ්‍රිතව ප්‍රධාන ගංගා දෙකක මූලයයන් පිහිටා ඇත.
   D ගෝදාවරී නදිය පැහැදිලි ස්වභාවික දේශසීමාවකි. (………)

28. සාතවාහනයන්ගේ ආගමික හා සංස්කෘතික වර්ධනයෙහිලා වැදගත් වන්නේ

A ස්තූප නිර්මාණය ආරම්භ වීම නිසා
B බුද්ධාගමේ හින්දු ව්‍යාප්තිය නිසා
C අමරාවතී කලා සම්ප්‍රදායික මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම නිසා
D ඉන්දියාවට ක්‍රිස්තු ධර්මය හඳුන්වාදීම නිසා. (………)

29. කාලිංගයේ චේදි රාජවංශය
A මෞර්‍ය්‍ය පාලකයන් කාලිංගය නිදහස් කරගත් බාරවේල එහි චේදි පාලනයක් පිහිටුවීය.
B ඔහු දැඩි බෞද්ධ අනුග්‍රාහකයකු විය.
C බාරවේල ඔහුගේ අටවන හා දොළොස්වන රාජවර්ශවලදී මගධයට එරෙහිව ආක්‍රමණ මෙහෙයවීය.
D ඔහුගේ රාජ්‍ය කාලය පිළිබඳ අගනා තොරතුරු හත්ථිගුම්බා සෙල්ලිපියෙන් හමුවේ. (………)

30. කණිෂ්ක රජු සමයේ දී
A දක්ෂිණ පථයට බුද්ධාගම ගැන හඳුන්වාදෙන ලදි.
B ඉන්දියාවේ මූර්ති කලාවේ බලපෑමට ග්‍රීසිය දැඩි ලෙස හසුවිය.
C හතරවැනි ධර්ම සංගායනාව පැවැත්විණි.
D ඉන්දීය අධිරාජ්‍යය බලය මධ්‍යම ආසියාව තෙක් විහිදී ගිය බව දක්නට ලැබුණි. (………)

❖ අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා
(A) සහ (B) පමණක් නිවැරදි නම් ……………………………….. 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ……………………………….. 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ……………………………….. 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ……………………………….. 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ………….. 5 ද, තිත් ඉර මත ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

31. කැබ්බේ බොක්කට ඇල මාර්ගයකින් සම්බන්ධ වූ හරප්පා වරාය නම් කරන්න.

1) නර්මදා 2) තප්ති 3) කෘෂ්ණ
4) මහානදී 5) කාවේරි (………)

32. ඉන්දියාවට ආක්‍රමණිකයන් ඇතුළු වූ හින්දුකුෂ් කඳුවැටිය හරහා වැටී ඇති කපොල්ල කුමක්ද?

1) ඔරිස්සා 2) බයිබර් 3) බැරෝඩා
4) බටහිර සාට්ස් 5) නිල්ගිරි (………)

33. පහත දැක්වෙන කෘති අතරින් පළමුවෙන්ම රචනා වූයේ කුමන කෘතිය ද?

1) උපනිෂද් 2) සාමවේදය 3) පුරාණ
4) ඍග් වේදය 5) අථර්වන් වේදය (………)

34. විශ්ව කර්ම ගුහාව පිහිටියේ කුමන ස්ථානයකද?

1) එල්ලෝරා 2) අජන්තා 3) භාග්
4) බදාමි 5) සාරානාත් (………)

35. රාෂ්ට්‍රකූට රාජවංශයේ ආරම්භකයා වූයේ,

1) පළවන ක්‍රිෂ්ණ 2) දන්තිදුර්ග 3) වින්දාශා ශක්ති
4) ධ්‍රැව 5) පළමු වන සාතකර්ණි (………)

❖ අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න වලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත.එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැ'යි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

| පළමු වැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැනි ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ඉන්දු නිම්න වැසියන්ගේ ප්‍රධාන වගාව වූයේ වී ගොවිතැනය. | ඉන්දු නිම්න වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂි කර්මාන්තයයි. | (………) |
| 37. | වෛදික යඥයේ ආරම්භවූයේ ගෘහ අග්නිය හෙවත් නිවසේ දල්වන ගින්න ඇසුරිනි. | යාඥය ජෛනයන් විසින් ඉටු කරනු ලැබූ පූජා විධියකි. | (………) |
| 38. | අශ්වඝෝෂ වාසය කලේ ක්‍රි.ව 4 වන සියවසය. | ඔහු විසින් මහා භාෂ්‍යය හා ස්වප්න වාසවදත්තා රචනා කරන ලදි. | (………) |
| 39. | අලහාබාද් ප්‍රශස්තිය සමුද්‍රගුප්ත රජු විසින් රචනා කරන ලදි. | සමුද්‍ර ගුප්ත රජුගේ දිග්විජය පිළිබඳ තොරතුරු අලහාබාද් ප්‍රශස්තියෙන් හෙළි වේ. | (………) |
| 40. | චේදි වංශයේ ඛාරවේල විසින් කාලිංගය නිදහස් රාජ්‍යයක් බවට පත්කරන ලදි. | පසුව අශෝක විසින් මෙම රාජ්‍යය දරුණු සටහනකින් අනතුරුව යටත්කර ගන්නා ලදි. | (………) |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 13 |

# තෙවන වාර පරීක්ෂණය 2024
# ඉන්දීය ඉතිහාසය

පාසලේ නම : ..............................................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................  කාලය : පැය 3

**උපදෙස්**

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A,B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක් වත් තෝරාගෙන තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

## II කොටස

1)

| | | | | | |
|---|---|---|---|---|---|
| i. | ලෝතාල් | ii. | වින්ධ්‍යා කඳුවැටිය | iii. | මක්‍රාන් කපොල්ල |
| iv. | තාම්‍රලිප්ති | v. | යමුනා ගඟ | vi. | ඉන්ද්‍රප්‍රස්ථ |
| vii | තක්ෂිලා | viii | හරප්පා | iv | මලබාර් වෙරළ |
| x. | ක්‍රිෂ්ණ නදිය | xi | සුප්පාරක | xii | මථුරා |

## B කොටස

2) පුරාතන ඉන්දීය ඉතිහාසය හැඩගැස්වීම කෙරෙහි භූගෝලීය ලක්ෂණ බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 16)

3) ''ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පුරාවට බහුවිධ ආගමික ලක්ෂණ රැසක් දැකගත හැකිය.''

   i. ඉන්දු නිම්න වාසීන්ගේ ආගමික විශ්වාසයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   ii. ඉන්දු නිම්න වාසීන්ගේ කලා නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   iii. ඉන්දු නිම්න වාසීන්ගේ ආගමික විශ්වාසයන් සම්බන්ධයෙන් ඉහත ප්‍රකාශය සමඟ ඔබ කොතෙක් දුරට එකඟවේද? හේතු දක්වන්න. (ලකුණු 12)

4) ක්‍රි.පූ හයවන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 16)

5)
   i. ගණ රාජ්‍යය
   ii. අශෝක රජු
   iii. මහා ඇලෙක්සැන්ඩර්
   iv. ක්‍රි.පූ 6 වැනි සියවසේ උතුරු ඉන්දියාවේ පැවති ආගමික වර්ධනයන්

   (එක් කොටසකට ලකුණු 8 බැගින්. 8x2 = 16 යි.)

C කොටස

6) පශ්චාත් මෞර්‍ය්‍ය යුගයේ විදේශීය බලවේගයන් වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

7) චෝළයන්ගේ විදේශ ප්‍රතිපත්ති සාකච්ඡා කරන්න.

8) කුෂාණ වංශයේ ශ්‍රේෂ්ඨ පාලකයකුගේ කණිෂ්ක රාජ්‍යය සමයේ වැදගත්කම පහත මාතෘකා දෙක යටතේ සාකච්ඡා කරන්න.

1) දේශපාලන වර්ධනය
2) ආගමික හා සංස්කෘතික වර්ධනය


(එක් කොටසකට ලකුණු 8 බැගින්. 8x2 = 16 යි.)

9) i. සමුද්‍රගුප්ත රජු
ii. බෙංගාලයේ පාලකවරුගේ ආගමික හා සංස්කෘතික වර්ධනය
iii. පුලකේෂින්ගේ චාලුක්‍ය්‍ය බල ව්‍යාප්තිය
iv. චෝළ පරිපාලනයේ මුඛ්‍ය ලක්ෂණ

(එක් කොටසකට ලකුණු 8 බැගින්. 8x2 = 16 යි.)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!




PAST PAPERS WIKI



(10) WWW.PastPapers.WiKi (10)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!